ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2015

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

මෙම විභාගයට මුහුණදුන් අයදුම්කරුවන් ඒඒටී ශ්‍රී ලංකා නව විෂය නිර්දේශය යටතේ විභාගයට මුහුණදුන් ප්‍රථම කණ්ඩායමයි.

පිරිවැය ගිණුම්කරණ සංකල්පයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ මෙම ප්‍රශ්න පත්‍රය, අනිවාර්ය ප්‍රශ්න 10 කින් සමන්විත විය. උත්තර සැපයීමේදී භාවිතා කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමඟ අමුණා තිබුණි.

ප්‍රශ්න 10 පහත ආකාරයට සකස් වී තිබුණි.

**A කොටස - ලකුණු 20**

ලකුණු 01, 02 හා 03 බැගින් හිමිවන අනිවාර්ය වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න වලින් සමන්විත විය.

**B කොටස - ලකුණු 25**

ලකුණු 05 බැගින් හිමිවන අනිවාර්ය ප්‍රශ්න 5 කින් සමන්විත විය.

**C කොටස - ලකුණු 30**

ලකුණු 10 බැගින් හිමිවන අනිවාර්ය ප්‍රශ්න 3 කින් සමන්විත විය.

**D කොටස - ලකුණු 25**

ලකුණු 25 ක් හිමිවන අනිවාර්ය ප්‍රශ්නයකින් සමන්විත විය.

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතය සතුටුදායක මට්ටමක පැවතුණි. විභාගයේ දී අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණ ද එක් එක් ප්‍රශ්නයට කාලය වෙන් කර ගැනීමේ දී අයදුම්කරුවන්ට ගැටළු පැවති බව නිරීක්ෂණය විය. එබැවින්, ඔවුන්ට ප්‍රශ්න 1 ක් හෝ 2 ක් කැප කිරීමට සිදුව තිබුණි. කෙටි හා නිශ්චිත පිළිතුරු විභාග පරීක්ෂකවරයා විසින් අපේක්ෂා කර තිබුණ ද ඇතැම් අයදුම්කරුවන් විසින් ඉතා දීර්ඝ පිළිතුරු ලබා දී තිබුණි. එක් එක් ප්‍රශ්නයට ලබා දෙන ලකුණු ප්‍රමාණය අනුව එම ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් විසින් වැය කළ යුතු කාලය හා අපේක්ෂා කරන පිළිතුරෙහි ප්‍රමිතිය පිළිබඳව අයදුම්කරුවන්ට මඟ පෙන්වීමක් ලබා ගත හැකිය.

මෙම කුසලතා වැඩි දියුණු කර ගැනීම සඳහා අයදුම්කරුවන් විසින් විභාගයට පෙනී සිටීමට පෙර ස්ව-අධ්‍යයන පොත්, ආදර්ශ ප්‍රශ්න පත්‍ර හා අනෙකුත් සමාන විභාගවල ප්‍රශ්න පත්‍ර පුහුණු විය යුතුය.

### A කොටස

**ප්‍රශ්න අංක 01** (ලකුණු 20)

ප්‍රශ්න 7 කින් සමන්විත වූ මෙම ප්‍රශ්නය මගින් සමස්තයක් ලෙස පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය පිළිබඳව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කරන ලදී. සෑම අයදුම්කරුවකුම පාහේ මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ කර තිබුණ ද කිහිප දෙනෙකුට පමණක් සැළකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබාගත හැකිවිය.

මෙවැනි ආකාරයේ ප්‍රශ්නවලට සාර්ථකව උත්තර සැපයීම සඳහා අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණයේ මූලිකයන්/ මූලික සංකල්ප පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත විය යුතුය.

පොදුවේ ගත් කළ මෙම ප්‍රශ්නයේ 1.6 හා 1.7 කොටස් සඳහා බොහෝ අයදුම්කරුවන් දුර්වල පිළිතුරු සපයා තිබුණි.

## B කොටස

### ප්‍රශ්න අංක 02 (ලකුණු 05)

පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය යොදා ගනිමින් 2015 ජුනි 30 දිනට තොගයේ අගය තක්සේරු කිරීමට අයදුම්කරුවන් සතු දැනීම විමසා බැලීමට මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ ගෙන තිබූ අතර ඉන් ඉතා ඉහළ ලකුණු ප්‍රමාණයක් ද අත්කර ගෙන තිබුණි.

මෙම ප්‍රශ්නයේදී තොග ලෙජරය පිළියෙල කිරීම අවශ්‍ය නොවූ බැවින්, අයදුම්කරුවන්ට වැඩි කාලයක් වැය කිරීමකින් තොරව ඒ සඳහා පිළිතුරු සැපයීමට හැකියාව තිබුණි.

### ප්‍රශ්න අංක 03 (ලකුණු 05)

සීමිත සින්ක් සමාගම සඳහා නිෂ්පාදන පොදුකාර්ය විභජනය කර බෙදාහරින ආකාරය දක්වන ප්‍රකාශනයක් මෙම ප්‍රශ්නය යටතේ අයදුම්කරුවන් විසින් පිළියෙල කළ යුතු විය.

සෑම අයදුම්කරුවකුම පාහේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ ගෙන තිබූ අතර ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමටද හැකිවී තිබුණි. කෙසේ වෙතත්, ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය කියවීමේ දී එය වරදවා තේරුම් ගෙන තිබූ අතර සේවා දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය ප්‍රතිවිභාජනය කිරීමෙන් වැළකී සිටි බව නිරීක්ෂණය විය.

එසේම, ඇතැම් අයදුම්කරුවන් දැනටමත් වෙන් කර ඇති වක්‍ර ද්‍රව්‍ය හා වක්‍ර ශ්‍රම පිරිවැයන් සිය ගණනය කිරීම්වලට ඇතුළත් කර නොතිබුණි.

**පොදු අඩුපාඩු :**

- බොහෝ අයදුම්කරුවන් අගයන් දහස් වලින් ('000) ලියවීමේදී පටලවා ගෙන තිබූ අතර සාමාන්‍ය ආකාරයට දීර්ඝ ඉලක්කම් ලියා තිබුණි.
- බොහෝ අයදුම්කරුවන් සේවා දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට ප්‍රති විභාජනය කිරීමට අමතක කර තිබුණි.

### ප්‍රශ්න අංක 04 (ලකුණු 05)

මෙම ප්‍රශ්නය මගින් ආන්තික පිරිවැයකරණ ක්‍රමය භාවිත කරමින් ලාභ ප්‍රකාශනයක් පිළියෙල කිරීමට අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කරන ලදී. මෙම මාතෘකාව සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට ඇති දැනුම ඉතා සීමිත බව ලබා දී තිබූ පිළිතුරුවලින් සනාථ විය. ඇතැම් අයදුම්කරුවන් ලාභ ප්‍රකාශනයක් වෙනුවට ලාභා'ලාභ ප්‍රකාශනයක් පිළියෙල කර තිබුණි. බොහෝ දෙනා අවසන් තොගය ගණනය කිරීමට අසමත් වීම නිසා එයට හිමි ලකුණු මඟහැරී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය එතරම් සතුටුදායක මට්ටමක නොපැවතිණි.

### ප්‍රශ්න අංක 05 (ලකුණු 05)

මෙම ප්‍රශ්නය මගින් සමච්ඡේදන ලක්ෂ්‍යය හා සුරක්ෂිත ආන්තිකය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. ප්‍රශ්නය ඉතා සරල වුවත්, බොහෝ දෙනාට මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගත නොහැකි විය. ප්‍රශ්නය මගින් අයවැය ගත වාර්ෂික ස්ථාවර පිරිවැය ලබා දී ඇති බැවින් අයුදම්කරුවන් මාසික ස්ථාවර පිරිවැය ගණනය කිරීම සඳහා එම අගය 12 න් බෙදිය යුතු වුවත් බොහෝ අයදුම්කරුවන්ට එම ගැළපීම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වූහ. ඒ අනුව අනෙකුත් කොටස් සඳහා ද නිවැරදි පිළිතුරු සැපයීමට ඔවුන් අසමත් වී ඇත. එමෙන්ම ඇතැම් අයදුම්කරුවන් සූත්‍රයන් පටලවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක 06 (ලකුණු 05)

මෙම ප්‍රශ්නය ප්‍රමිත පිරිවැයකරණය මත පදනම් වූ අතර (a) කොටස මගින් ප්‍රමිත පිරිවැයකරණයේ වාසි ද (b) කොටස මගින් BM නිෂ්පාදිතය සඳහා ප්‍රමිත පිරිවැය පත්‍රය ද පිළියෙල කළ යුතු විය. මෙම ප්‍රශ්නය පහසුවෙන් ලකුණු ලබාගත හැකි ඉතා සරල ප්‍රශ්නයක් විය.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ ගෙන තිබූ අතර ලකුණු 4 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට හැකිවී තිබුණි. කෙසේ වෙතත්, අයදුම්කරුවන් කිහිප දෙනෙක් BM නිෂ්පාදිතයට ප්‍රමිත පිරිවැය පත්‍රය පිළියෙල කරනු වෙනුවට සෘජු ද්‍රව්‍ය x හා y සඳහා වෙන වෙනම පිරිවැය පත්‍ර පිළියෙල කර තිබුණි.

### C කොටස

## ප්‍රශ්න අංක 07 (ලකුණු 10)

මෙම ප්‍රශ්නය පෙරසැරි පිරිවැයකරණය මත පදනම් වූ අතර සාමාන්‍ය පිරිවැය ක්‍රමය (Average Cost-AVCO) යොදා ගනිමින් නිෂ්පාදන පිරිවැය අගය කිරීමේ ප්‍රකාශනය සහ A පෙරසැරි ගිණුම පිළියෙල කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් 90% ක් පමණ මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබූ නමුත් කාර්යසාධනය එතරම් සතුටුදායක මට්ටමක නොපැවතිණ.

උත්තර පත්‍රවල දැකිය හැකි වූ පොදු දුර්වලතාවයක් වූයේ නිෂ්පාදන පිරිවැය අගය කිරීමේ ප්‍රකාශනය පිළියෙල කිරීමෙන් තොරව පෙරසැරි ගිණුම පිළියෙල කිරීමය. බොහෝ අයදුම්කරුවන් අසාමාන්‍ය අපතය හා නොනිමි තොග සඳහා සමානුපාතික ඒකක නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් විය. එසේම අයදුම්කරුවන් කිහිප දෙනෙකුට පෙරසැරි ගිණුම පිළියෙල කරන ආකාරය පිළිබඳව අවබෝධයක් නොතිබූ අතර ඔවුන් වෙනස් ආකාරයේ ආකෘතීන් (ප්‍රකාශන ආකෘතීය) භාවිතා කර තිබුණි. බහුතර අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව සාමාන්‍ය අපතය ගණනය කර තිබූ නමුත් එය "සුන්බුන් අයිතම ගිණුම" වෙනුවට "සාමාන්‍ය අපතය" ලෙස පෙරසැරි ගිණුම තුළ දක්වා තිබුණි.

කෙසේ වෙතත් සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා වෙන්කළ මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වූහ.

## ප්‍රශ්න අංක 08 (ලකුණු 10)

මෙම ප්‍රශ්නය මගින් ද්‍රව්‍ය, ශ්‍රමය හා විකුණුම්වලට අදාළ මූලික විචලනයන් ගණනය කිරීමට අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂාවට ලක්කරන ලදී. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණු අතර කිහිප දෙනෙක් ඊට පිළිතුරු සැපයීමට උත්සාහ කර නොතිබුණි. උත්සාහ කර තිබූ අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු පිරිසක් ද්‍රව්‍ය භාවිත විචලනයන් හා ශ්‍රම කාර්යක්ෂමතා විචලනය නිවැරදිව ගණනය කර නොතිබුණි. ඔවුන් විචලනයන්ට අදාළ සූත්‍රය පිළිබඳ අවබෝධයකින් නොසිටි බවත්, විචලනයන් වාසිදායක ද අවාසිදායක ද යන්න සඳහන් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක 09 (ලකුණු 10)

සංකලිත ගිණුම්කරණ පද්ධතියකට අනුව දී ඇති ගණුදෙනු සටහන් කර ලෙජර් ගිණුම් පිළියෙල කිරීමට මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර නොතිබූ අතර, උත්සාහ කර තිබූ අයදුම්කරුවන් අතරින් ද නිවැරදි පිළිතුරු කිහිපයක් පමණක් නිරීක්ෂණය විය. බොහෝ අයදුම්කරුවන්ට විෂය නිර්දේශයේ මෙම මාතෘකාව සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් නොතිබිණි. සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මූල්‍ය ගිණුම්කරණයට අනුව ලෙජර් ගිණුම් පිළියෙල කර තිබූ අතර ඇතමුන් මූල්‍ය ගිණුම්කරණයට අනුව ජර්නල් සටහන් පවා පිළියෙල කර තිබුණි.

එම නිසා, මෙම මාතෘකාව හොඳින් අධ්‍යයනය කිරීමටත් සමාන ගණයේ ප්‍රශ්න පුහුණුවීමටත් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**ප්‍රශ්න අංක 10** (ලකුණු 25)

මෙම ප්‍රශ්නය මගින් මාස හතරක් සඳහා මාසික පදනම මත මුදල් අයවැය පිළියෙල කිරීමටත්, 2015 ඔක්තෝබර් 31 දිනට අමු ද්‍රව්‍ය තොග, ණය ගැති හා ණයහිමි ශේෂයන් ගණනය කිරීමට හා අයවැයකරණය සම්බන්ධයෙන් ඉහළ සිට පහළට වූ ප්‍රවේශය (Top - down approach) සහ පහළ සිට ඉහළට වූ ප්‍රවේශය (Botten - up approach) අතර වෙනස පැහැදිලි කිරීමටත් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී.

සෑම අයදුම්කරුවකු පාහේ මේ සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබූ නමුත් ලබා දී තිබූ පිළිතුරු ඉතා දුර්වල මට්ටමක හා නියමිත ප්‍රමිතියෙන් පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. බොහෝ අයදුම්කරුවන්ට බෙදා හැරීමේ හා පරිපාලන වියදම් නිවැරදිව සඳහන් කිරීමට අදාළ ලකුණු පමණක් ලබාගත හැකිවිය. බහුතරයක්, ණයගැතියන්ගෙන් ලැබීම් නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වූහ. අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට අදාළ ගෙවීම් ගණනය කිරීමට බොහෝ අයදුම්කරුවන් උත්සාහ කර නොතිබුණි. උත්සහ කළ අයවලුන් ද එක් එක් මාසයට අදාළ ගෙවීම් ලෙස වැරදි අගයන් දක්වා තිබුණි. මීට ප්‍රධාන හේතුව වූයේ අයවැය පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමානුකූල ප්‍රවේශය පිළිබඳව අයදුම්කරුවන්ට නිසි අවබෝධයක් නොමැති වීමයි. එනම්, සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ගෙවීම් ගණනය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් ප්‍රථමයෙන් නිෂ්පාදන අයවැය පිළියෙල කර ඉන් පසුව අමුද්‍රව්‍ය මිලදී ගැනීම් අයවැය පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලිය බොහෝ අයදුම්කරුවන්ට මඟහැරී තිබුණි. ඇතැම් අයදුම්කරුවන්ට මුදල් අයවැයට අදාළ ආකෘතිය පිළිබඳව පවා නිසි අවබෝධයක් නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඇතැමුන් මාසික පදනම මත අයවැය පිළියෙල කිරීමෙන් තොරව මුළු කාර්තුව සඳහාම එක් අයවැයක් පිළියෙල කර තිබුණි.

ප්‍රශ්නයේ (c) කොටස සඳහා, අයදුම්කරුවන්ගෙන් 90% ක් පමණ වචනවල සාමාන්‍ය අදහස පමණක් ලියා තිබුණි. කෙසේ වෙතත්, පිළිතුරුවල ගුණාත්මක බව ඉතා දුර්වල මට්ටමක පැවති අතර බොහෝ පිළිතුරු ප්‍රශ්නයට අදාළ නොවන සේ ලියා තිබුණි. ප්‍රශ්නය කියවීමේදී තිබූ නොසැලකිල්ල බොහෝ වැරදිවලට හේතු වූ බව නිරීක්ෂණය විය.

ප්‍රශ්න අංක 10 සඳහා අයදුම්කරුවන් කිහිපදෙනෙක් පමණක් සැළසුමකට අනුව පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබූ අතර ඒ අනුව නිවැරදි පිළිතුර ගොඩනගා ගෙන තිබුණි. ඔවුන් නිවැරදි ආකෘතිය තෝරා ගෙන තිබූ අතර සුදුසු ආකෘතියට අනුව සිය පිළිතුර ඉදිරිත් කර තිබුණි. එමගින් ඔවුන්ට එකම කාර්යය දෙවතාවක් කිරීමෙන් වැළකී සිටීමටත් සිය කාලය ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමටත් හැකි වී ඇත. පරීක්ෂකවරයාට නිවැරදි අගයන් තෝරා ගෙන ලකුණු ලබාදිය හැකි පරිදි ඔවුන් අදාළ පෙරවැඩ ඉදිරිපත් කර තිබුණි.

**අයදුම්කරුවන්ගේ අවබෝධතා මට්ටම ගොඩනඟා ගැනීමේදී සැළකිලිමත් විය යුතු පොදු කරුණු**

1. ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු විට ලබාදී ඇති උපදෙස් සැළකිල්ලෙන් කියවිය යුතුය.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා ප්‍රශ්නය මගින් අසා ඇති දේට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අනවශ්‍ය දේ ලිවීමෙන් වැළකී සිටිය යුතුය.
3. කාලය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කර ගැනීම.
4. උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංකයන් හා විභාග අංකය නිවැරදිව ලියා ඇත්දැයි පරීක්ෂා කළ යුතුය.
5. පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීම තුලින්, විෂය සම්බන්ධ ඔබගේ දැනුම හා පිළිතුරු සැපයීමේ හැකියාව වැඩිදියුණු කර ගත හැකිය.
6. විභාගය සමත්වීමේ මූලික අරමුණින් යුතුව විභාගයට පෙනී සිටීම.

- * * * -